දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපෑල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல )
My No. ) DPRD/OP/04 /2017

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி )
Date ) 26.05. 2017

# සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதார,போசணை மற்றும் சுதேச வைத்திய அமைச்சு
# Ministry of Health, Nutrition & Indigenous Medicine

---

සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වරුන්,
සියළුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වරුන්,
සියළුම පළාත් හා ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂවරුන්,
සියළුම දිස්ත්‍රික් මහරෝහල් හා මූලික රෝහල් වෛද්‍ය අධිකාරීවරුන්,
සියළුම ප්‍රාදේශීය රෝහල් ප්‍රධානීන්,
සියළුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්.

**ආපදාවට පත් දිස්ත්‍රික්ක සඳහා සහන වෛද්‍ය සේවා කණ්ඩායම් යැවීම.**

ආපදාවට පත් දිස්ත්‍රික්ක සඳහා සහන වෛද්‍ය සේවා කණ්ඩායම් යැවීමේදී එම සහන වෛද්‍ය සේවා කණ්ඩායමට අවශ්‍ය වන ඖෂධ, එම වෛද්‍ය සේවා කණ්ඩායම යවනුලබන සෞඛ්‍ය ආයතනයෙන්ම ලබාදියයුතුය .

ඒ අනුව ඔබගේ ආයතනයෙන් යවනු ලබන සහන වෛද්‍ය සේවා කණ්ඩායම් වලට අවශ්‍ය වන ඖෂධ, සුදුසු ඖෂධවේදියෙකුද සමග ඔහුගේ බාරයේ නිකුත්කිරීමට කටයුතු කලයුතුය.
මේ සඳහා සහභාගී වන නිලධාරීන්ගේ රාජකාරී නිවාඩු හා ප්‍රවාහන පහසුකම් අදාල යායතන ප්‍රධානීන් විසින් ලබා දිය යුතුය.

එමෙන්ම එම කණ්ඩායම් දින කිහිපයක් එම ප්‍රදේශ වල නැවති සිටී නම් ඔවුන් සඳහා අවශ්‍ය නවාතැන් පහසුකම් හා ආහාරපාන, ආපදාවට පත් ප්‍රදේශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් සැපයිය යුතුය. ආපදා මෙහෙයුම් කටයුතු සඳහා ඔබවෙත සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් ලබා දී ඇති අරමුදල් වලින් මෙම වියදම් පියවිය හැකි අතර, තවදුරටත් අරමුදල් අවශ්‍ය වේ නම් ඒ බව නොපමාව මා වෙත දැනුම් දීමට කටයුතු කරන්න.

තවද මෙම සහන කණ්ඩායම් යැවීමේදී, අදාල පළාතේ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී සමග සාකච්චා කර, ඔවුන්ගේ අවශ්‍යතාවයන් අනුව මෙම කණ්ඩායම් යැවීමට කටයුතු කල යුතුය.

මෙම කරුණු පිලිබඳ යම් ගැටළුවක් පවතී නම් දුරකථන අංක 0113071073 , 0113092269 මගින් ආපදා පෙරසූදානම් ඒකකය අමතා වැඩිදුර තොරතුරු ලබා ගත හැක.

මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

වෛද්‍ය සරත් අමුණුගම
වැ.බ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

වැ. බ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ10.